2007 ජූනි
51 වසර 10 කලාපය
ISSN 1391- 3034

නවයුගය
NAVAYUGAYA SINHALA MONTHLY MAGAZINE

51st Year 10th Issue
2007 June

# ගෝලීය උණුසුම පිටුදැකීමට සාමූහිකව එක්වෙමු



මිහිතලය උණුසුම් වීම සමස්ත ලෝකයට ම අද තර්ජනයක් වී ඇත. මිහිතලය උණුසුම් වීමත් සමඟ ම මෙතෙක් පැවති කාලගුණ සහ දේශගුණ රටාවේ බරපතල වෙනස් වීම් සිදු වන්නට පටන් ගෙන ඇත.

මෑතක දී ලොව පුරා විවිධ රටවල මහා විනාශ ඇති කරමින් ඇද වැටුණු ධාරානිපාත වර්ෂාවලට හේතුව මිහිතලය උණුසුම් වීම බව විද්‍යාඥයෝ පෙන්වා දෙති.එමෙන් ම අසාමාන්‍ය නියඟයන් ඇති වීමට ද මිහිතලය උණුසුම් වීම බලපා ඇත. මේ හේතූන් නිසා ලොව පාරිසරික සමතුලිතතාව ද අද දැඩි අභියෝගයකට ලක් වී පවතී. පාරිසරික අසමතුලිතතාවේ ප්‍රතිඵලයක් හැටියට ජෛව විවිධත්වයට ද තර්ජන එල්ල වී ඇත.

මිහිතලය උණුසුම් වීමෙන් උතුරු අර්ධ ගෝලයේ සහ දකුණු අර්ධ ගෝලයේ හිම කඳු දිය වන්නට පටන් ගෙන ඇත. ඒ නිසා මුහුදු ජල මට්ටම ඉහළ යන්නටත් අයිස් දියවීම නිසා වාතයට කාබන්ඩයොක්සයිඩ් වායුව වැඩි ප්‍රතිශතයක් එකතු වන්නටත් පටන් ගෙන ඇත. මුහුදේ ජල මට්ටම ඉහළ යාම හේතුවෙන් කුඩා දූපත් බොහොමයක් ජලයෙන් යට වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇත.

මේ සියලු විපර්යාස ඇති වීමට ප්‍රධාන හේතුව මිනිසා ගේ ඊනියා දියුණුව නිසා ලොව කාර්මීකරණය වීම බව ද කියති. අධික කාර්මික නිෂ්පාදන නිසා වායු ගෝලය අපිරිසිදු වීමේ ප්‍රතිඵලය ඕසෝන් වියන පළුදු වීම ය. එයින් පෘථිවිය කරා පැමිණෙන අහිතකර පාරජම්බුල කිරණ ප්‍රමාණය වැඩි වේ. පිළිකා රෝග, ස්වසන ආබාධ, ප්‍රතිශක්ති පද්ධති දුර්වල වීම සහ විවිධ රෝග ආබාධ ඇතිවීම එහි ප්‍රතිඵල වේ.

මේ අනුව මේ විනාශය මිනිසාට පමණක් නොව සමස්ත සත්ත්ව සංහතියට ම අහිතකර ලෙස බලපාන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ලෝකය පුරා මේ ප්‍රශ්නය පිළිබඳ දැඩි ආන්දෝලනයක් ඇති වී තිබෙන්නේ මේ නිසා ය. ලොව බලගතු කාර්මික රටවල ජනතාව, සංවිධාන සහ විද්‍යාඥයන් පවා අද ඒ රටවල ක්‍රියා පිළිවෙත්වලට එරෙහිව හඬ නඟන්නට පටන් ගෙන ඇත්තේ මෙහි ඇති අනතුර ඔවුන් හොඳින් වටහා ගෙන ඇති නිසා ය. අමෙරිකානු උප ජනාධිපති අල් ගෝ පවා අද මේ වෙනුවෙන් ප්‍රබල හඬක් නඟමින් මිහිතලය උණුසුම් වීමේ තර්ජනයට පිළියම් යෙදීමේ දැඩි අවශ්‍යතාව පෙන්වා දී ඇත.

මිහිතලය උණුසුම්වීම වැළැක්වීමට නම් සමස්ත ලෝකයා ම එක්ව කටයුතු කළ යුතු ය. තම තමන්ගේ රටවලින් එල්ල වන තර්ජන අවම කර ගැනීමට කටයුතු කරන අතරේ ම හිතුවක්කාර බලගතු රටවල් මඟින් සිදු කරන විනාශයන්ට එරෙහිව ලෝක ජනමතයක් ගොඩනැඟීමට ලොව ලොකු කුඩා සෑම රටක් ම සෑම අන්තර් ජාතික සංවිධානයක් ම, සෑම පාරිසරික සංවිධානයක් ම අත්වැල් බැඳ ගත යුතු ය.



මෙහිදී පාසල් දරුවන් සහ තරුණ ප්‍රජාව දැනුවත් කිරීම අතිශයින් වැදගත් වේ.

ඒ අනාගතය රැඳී පවතින්නේ ඔවුන් අත නිසා ය. නවයුගය අද කවරයේ කතාව මිහිතලය උණුසුම්වීම සම්බන්ධව වෙන් කෙරුණේ ඒ නිසා ය. ❐

